# ධම්මපදය

## පුප්ඵ වර්ගය (15-16 ගාථා)

**15.** ගාථාව

**"යථා සඞ්කාරධානස්මිං - උජ්ඣිතස්මිං මහාපථේ,**
**පදුමං තත්‍ථ ජායේථ - සුචිගන්‍ධං මනෝරමං".**

**16.** ගාථාව

**"ඒවං සඞ්කාරභූතේසු - අන්‍ධභූතේ පුථුජ්ජනේ,**
**අතිරෝචති පඤ්ඤාය - සම්මාසම්බුද්ධසාවකෝ."**

පදගතාර්ථය - **15** ගාථාව

| | |
|---|---|
| මහාපථෙ | - මහාමාර්ගයෙහි |
| **උජ්ඣිතස්මිං** | - දමන ලද්ද වූ |
| **තත්‍ථ සඞ්කාරධානස්මිං** | - ඒ කසළ ගොඩෙහි |
| **සුචිගන්‍ධං** | - මනා සුවඳ ඇති |
| **මනෝරමං** | - සිත්කලු වූ |
| **පදුමං** | - පියුමක් |
| **යථා ජායෙථ** | - යම් සේ හටගනී ද |

පදගතාර්ථය - **16** ගාථාව

| | |
|---|---|
| **ඒවං** | - එපරිද්දෙන් (මෙසේ) |
| **සඞ්කාරභූතේසු** | - කසළ ගොඩක් බඳු වූ |
| **අන්‍ධභූතේ** | - නුවණ නැති හෙයින් අන්‍ධ වූ |
| **පුථුජ්ජනේ** | - පෘථග්ජනයා අතරෙහි |
| **සම්මාසම්බුද්ධසාවකෝ** | - සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක තෙමේ |
| **පඤ්ඤාය** | - ප්‍රඥාවෙන් |
| **අතිරෝචති** | - (පෘථග්ජනයා ඉක්මවා) අතිශයින් බබළන සේක. |

භාවාර්ථය - **15** ගාථාව

මහමග දැමූ කසළ ගොඩක මනා සුවඳැති සිත්කලු වූ පියුමක් හටගන්නේ යම් සේ ද,

භාවාර්ථය - **16** ගාථාව

කසළ ගොඩක් බඳු අන්‍ධ වූ පෘථග්ජනයන් අතරෙහි උපන් සම්මාසම්බුදුරජුන්ගේ ශ්‍රාවක තෙමේ ප්‍රඥාවෙන් පෘථග්ජනලෝකයා ඉක්මවා බබළයි.

නිදාන කථාව

අප බුදුරජාණන් වහන්සේ වැඩසිටි දවස සැවැත් නුවර සිරිගුත්ත-ගරහදින්න යයි යහළුවෝ දෙදෙනෙක් වූහ. සිරිගුත්ත බෞද්ධයෙකි. ගරහදින්න නිගණ්ඨ-ශ්‍රාවකයෙකි. දවසෙක

නිගණ්ඨයෝ 'ඔබගේ යහළු වූ සිරිගුත්තට අප වෙත එන්නට, අපට දන් දෙන්නට සැලැස්සුවහොත් නරක ද?'යි' ගරහදින්නට කීහ.

ගරහදින්න තෙමේ නිගණ්ඨයන්ගේ මෙහෙයවීමෙන් නිතර සිරිගුත්තයන්ට අපගේ රහතුන් කරා අවුත් වැඳපුදා දන් දෙනු මැනැවැ'යි කියන්නේය. සිරිගුත්ත තෙමේ ද ගරහදින්න විසින් නිතර කියන මේ බස අසා 'නුඹගේ රහත්හු කුමක් දනිත් ද'යි විචාළ කල, 'අපගේ රහත්හු අතීත - අනාගත - වර්තමාන යන කාලත්‍රය පිළිබඳ සෑම දේ ම දනිති' යි කියා ගරහදින්න විසින් පිළිතුරු දෙනු ලැබූ හෙයින් 'එසේ නම් මාගේ ආරාධනාවෙන් පන්සියයක්දෙනාට ආරාධනා කරව' යි කීයේ ය. ගරහදින්න තෙමේ ද නිගණ්ඨයන් වෙත ගොස් එහි වැඩීමට ආරාධනා කළේය.

සිරිගුත්ත තෙමේ ගෙවල් දෙකකට මැද මහවළක් සාරවා එහි අසුචි, මඩ ආදිය පුරවා අසුන්ගත් කල්හි එහි වැටෙන සේ වළ වසා අසුන් පණවා තැබී ය. හිස් සැළිවල කට බැඳ දන් පුරවා ඇති බව දැක්වී ය.

ගරහදින්න එදින උදෑසන ම සිරිගුත්තගේ ගෙට ගොස් 'දනය පිළියෙළ කරන ලද ද' යි ඇසී ය. 'ඔවු! පිළියෙළ කළෙමි' යි කියා සිරිගුත්ත කී කල්හි 'පිළියෙළ කළේ කොතැන ද' යි ඇසී ය. 'මේ මේ සැළිවල බත් ය. මෙහි කැඳ ය. මෙහි කැවිලි ය' ආදි වශයෙන් භාජන පෙන්වූ පසු ව ආසන පණවා අවසාන බව ද ඇසීමෙන් අනතුරු ව ගරහදින්න ඔහුට ස්තුති කොට ගියේ ය.

ඉන්පසු පන්සියයක් නිගණ්ඨයෝ දනය පිණිස එහි ගියහ. සිරිගුත්ත නිගණ්ඨයන් නිවසට පැමිණෙන්නට පෙර ඉදිරියට ගොස් 'නුඹලා හැම තුන්කල් දන්නාහු ය'යි ගරහදින්න කියයි. ඉදින් සියල්ල නො දන්නාහු නම් මගේ ගෙට නො එවු' යයි සිතී ය. නිගණ්ඨයෝ තුන්කල් නො දන්නාහු ය. ඒනිසා එහි ගොස් අසුචි වළෙහි වැටුණාහ.

මෙයින් සිත් වේදනාවට පත් ගරහදින්න එතැන් සිට සිරිගුත්ත සමග කථා නො කර හැරියේ ය.

එහෙත් සිරිගුත්තගෙන් පලිගැනීමට සිතා සිරිගුත්ත වෙතට ගොස් නැවත මිතුරු විය. මේ අතර දවසෙක සිරිගුත්ත තෙමේ ගරහදින්නට, බුදුරජාණන් වහන්සේ වෙත ගොස් භාග්‍යවතුන්වහන්සේව ඇසුරු කරන්නටත් දන් දෙන්නටත් කීය. ගරහදින්න අපේක්‍ෂා කළේ මෙය වුව ද, එය නො දන්වා 'ඔබේ ශාස්තෘවරයා කුමක් දන්නේ දැ'යි ඇසී ය. 'මාගේ ශාස්තෘවරයා සෑම දේ ම දනී. නො දන්නා දෙයක් නැත. සෑම කෙනෙකුගේ ම සිත සොළොස් අයුරින් දන්නා සේකැ' යි සිරිගුත්ත කී කල්හි, 'ඇයි ඔබ මෙතෙක් දවසක් ඒ බව මට නො පැවසුවේ? එසේ නම්, ඔබ ම ගොස් පන්සියයක්දෙනා වහන්සේ සමග හෙට දින අප නිවසට දනට වඩින්නට බුදුරජුට ආරාධනා කරන්නැ'යි ගරහදින්න කීය.

සිරිගුත්ත, බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට තමා පෙර නිගණ්ඨයන්ට කළ දේ දැන්වී ය. බුදුරජාණන් වහන්සේ ගරහදින්නගේ අදහස කුමක් දැ'යි බලන සේක් 'ගෙවල් දෙකක් මැද මහවළක් කරවා, කිහිරි දර පිලිස්සූ අඟුරින් වළ පුරවා මා ඇතුළු පන්සියයක්දෙනා එහි හෙළන්නට සිතයි' යනු දැක එහි වැඩම කිරීමෙන් වන අනුසස් සලකා ආරාධනාව පිළිගෙන පසුදින පන්සියයක් භික්ෂූන් සමඟ එහි වැඩි සේක.

බුදුරජාණන් වහන්සේගේ වැඩම කිරීම දකින්නා වූ ගරහදින්න ගෙයින් පිටතට අවුත් පසඟ පිහිටුවා වැඳ, 'ස්වාමීනි, ඔබ වහන්සේ තුන්කල් දන්නාසේකැ'යි සිරිගුත්ත කියයි. ඉදින් සියල්ල නො දන්නහු නම් මගේ ගෙට නො එවු' යි සිතී ය.

බුදුරජාණන් වහන්සේ තම සිරිපා වසා තිබුණු අඟුරුවළට දිගු කළ සේක. එකෙණෙහි වළ බිඳගෙන රියසකක් පමණ පියුම් නැඟී ආයේ ය. බුදුරජාණන් වහන්සේ පියුම් පිට වැඩම කොට පණවා තිබුණු ආසනයෙහි වැඩහුන් සේක. භික්ෂූහු ද එසේ ගොස් වැඩහුන්හ.

ඒ දුටු ගරහදින්නගේ සිරුරෙන් ඩහදිය ගලන්නට විය. ගරහදින්න සිරිගුත්තයන්ගෙන් පිහිට යදින්නට විය. එවිට සිරිගුත්ත තෙමේ 'කවර කාරණයක් නිසා ඔබ පිහිට යදින්නෙහි ද' යි ඇසූ කල, 'අහෝ! සඞ්ඝයා වහන්සේට දෙන්නට කැඳ, බත් පිළියෙළ කළේ නැතැ'යි කී විට 'මේ බත්හැළි, මේ කැඳහැළි කියමින් නොයෙක් හැළිවලන් පෙන්නුම් කරන ලද්දේ නො වේදැ'යි කියා ඇසූ විට ඒ හැළිවල කිසිවක් නැතැ'යි ගරහදින්න කීය. එවිට සිරිගුත්ත 'දැන් කුමක් කරමු ද?, නුඹ ගොස් ඒ හැළිවලන් ඇර බලව'යි කියා පිටත් කර හැරියේ ය. ඒ කී ලෙසින් සැළි ඇර බලත් ම එහි වූ සැම සැළියක් ම ඒ ඒ දෙයින් පිරී තුබුණු බව දැක පුදුමයට පැමිණ ගරහදින්න සතුටින් ඉපිල ගියේ ය.

හේ බුදුපාමොක් මහසඟන සකස්කොට වළඳවා අවසානයෙහි කොට අනුමෙවෙනිබණ අසනු කැමති ව බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය ගත්තේ ය. බුදුරජාණන් වහන්සේ බණ වදරන සේක් ' මේ සත්ත්වයෝ නුවණ නැති බැවින්, මාගේ ශ්‍රාවකයන්ගේත් මාගේ ශාසනයේත් ගුණ නො දනිත්. නුවණින් තොර වූවෝ අන්ධයෝ ය. පියවිඇස් නැත්තෝ ම අන්ධයෝ නො වෙති. නුවණින් යුක්ත වූවෝ ඇස් ඇත්තෝ වෙති. පියවිඇසින් තොර වූවත් නුවණ ඇත්තෝ නම් ඇස් ඇත්තෝ ම ය' යි වදරා ඉහත ගාථා දෙකෙන් ධර්මය දේශනා කළ සේක. බණ අසා සිරිගුත්ත - ගරහදින්න දෙදෙනා ම සෝවාන්-ඵලයට පැමිණියහ. බොහෝ ප්‍රාණීන්ට ධර්මාවබෝධ විය.

**ආත්මෝපදේශය** - පිරිසිදු චිත්තය ඔබ සත්‍යය කරා පමුණුවයි.

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(බක් 2552)

<u>**සම්පාදක:**</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>**පිටු සැකසීම:**</u> පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

<u>**ධර්මදානය:**</u> පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශිර්වාද පිණිස හා තමාට වහා චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීම පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**